## අධ්‍යක්ෂ (සංවර්ධන) - පොහොර තනතුර - ශ්‍රී ලංකා පරිපාලන සේවය/විධායක ගණය I ශ්‍රේණිය
## කෘෂිකර්ම අමාත්‍යාංශය

ඉහත සඳහන් තනතුරට පත් කිරීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිළධාරීන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ. පුරප්පාඩු සංඛ්‍යාව 01 කි.

සේවයේ/සේවා ගණයේ I ශ්‍රේණියේ නිළධාරීන් අයදුම්පත් ඉදිරිපත් කර නොමැති විට සේවයේ/සේවා ගණයේ II ශ්‍රේණියේ අවුරුදු 10ක සතුටුදායක හා සක්‍රීය සේවා කාලයක් සහිත නිළධාරීන් විසින් තනතුරට අයත් රාජකාරි පූර්ණකාලීනව ඉටු කිරීමේ පදනම මත සලකා බලනු ඇත.

රාජකාරි ඉටු කිරීම, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති 141 හි ප්‍රතිපාදනවලට යටත්ව වැඩිමනක් සේවා දීර්ඝයන් ලබා ගැනීමේ හැකියාව සහිතව එක් අවුරුදුකාලීන උපරිම සේවා කාලපරිච්ඡේදයක් සඳහා පත්වීම් ලබා දෙනු ඇත.

අමුණා ඇති ආකෘතියට සාරානුකූලව නියමිත පරිදි සම්පූර්ණ කරන ලද ජීව දත්ත පත්‍රිකා/අයදුම්පත් 2023.05.03 දින හෝ ඊට පෙර ලේකම්,කෘෂිකර්ම අමාත්‍යාංශය, 80/5, “ගොවිජන මන්දිරය”, රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල (ඊමේල් - adstateagri@gmail.com) ට ලැබෙන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් සහ අමුණා ඇති ආකෘතිය අනුව ඉදිරිපත් කර නොමැති අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

### 2.0. අයදුම්කරුවන් සපුරා තිබිය යුතු සුදුසුකම්

#### 2.1. පලපුරුද්ද හා වෘත්තීය සුදුසුකම්

i. රාජ්‍ය පරිපාලනය/සංවර්ධන ක්ෂේත්‍රයන්/විද්‍යාව/කෘෂිකර්මය පිළිබඳව අවම වශයෙන් අවුරුදු 03 ක පලපුරුද්ද
ii. රාජ්‍ය පරිපාලනය/කළමනාකරණය/ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය
iii. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය

#### 2.2. විශේෂ හැකියාවන්

i. පොහොර පිළිබඳ මනා දැනුමක් තිබීම
ii. ස්වාධීනව රාජකාරිවල නිරතවීම
iii. සන්නිවේදන කුසලතා

#### 2.3. චර්යාත්මක නිපුණතා

i. කාර්යක්ෂමතාව
ii. කැපවීම
iii. ඵලදායි කාර්ය සබඳතා පවත්වා ගැනීමේ හැකියාව

3.0. තෝරා ගැනීමේ ක්‍රමවේදය

(දීප ව්‍යාප්ත සේවා)

ඉදිරිපත් කර ඇති ජීව දත්ත තොරතුරු ඇසුරෙන් ජ්‍යෙෂ්ඨතාව ඇගයීමට ලක් කිරීම හා සම්මුඛ පරීක්ෂණය මත පදනම්ව තෝරා ගැනීම් සිදු කරනු ඇත. අවම සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

3.1. ලකුණු ලබාදීමේ ක්‍රමවේදය

රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 02/2022 හි ප්‍රතිපාදන ප්‍රකාරව මෙම තනතුරට පත් කිරීමේ දී ලකුණු ලබා දෙනු ලැබේ. 02/2022 චක්‍රලේඛයේ ඇමුණුම II ප්‍රකාරව ලකුණු ලබා දීමේ දී එක් එක් උපමාණයට අදාළව ඇගයුම් සිදු කෙරෙනු ඇත.

| **ශීර්ෂය** | **උපරිම ලකුණු** | **ඇගයුම් ක්‍රමවේදය** |
|---|---|---|
| **ජ්‍යෙෂ්ඨත්වය**<br>ඉහළම ජ්‍යෙෂ්ඨතාව ලබා ඇති අපේක්ෂකයන්ට උපරිම ලකුණු ලබා දෙනු ඇත. ජ්‍යෙෂ්ඨතාවේ අනුපිළිවෙළ අනුව සෙසු අපේක්ෂකයන්ට ලකුණු ලැබේ. මෙහිදී ඒ ඒ අපේක්ෂකයන්ගේ "සතුටුදායක සේවා කාලය" සැලකිල්ලට ගනු ලැබේ. | 50 | ජීව දත්ත තොරතුරු |
| **විද්‍යාව/කෘෂිකර්මය/සෙසු අදාළ ක්ෂේත්‍රයන්හි ලබා ඇති පළපුරුද්ද**<br>අදාළ ක්ෂේත්‍රයේ සේවා කාලයට අමතරව විෂයානුබද්ධ දැනුම ප්‍රසම්පාදනයේ හා පරිපාලනයේ ලබා ඇති දැනුම සහ විෂය ප්‍රාගුණ්‍ය ඇගයුමට ලක් කෙරෙනු ඇත. | 20 | |
| **වෘත්තීය සුදුසුකම්, පර්යේෂණ හා නවෝත්පාදන**<br>**(1) ආර්ථික විද්‍යාව/ව්‍යාපෘති කළමණාකරණ ක්ෂේත්‍රයන්හි ලබා ඇති පශ්චාත් උපාධි සුදුසුකම ***<br>(අ) පර්යේෂණ පාදක පශ්චාත් උපාධි - ලකුණු 7<br>(ආ) අධ්‍යයන පශ්චාත් උපාධි - ලකුණු 6<br>(ඇ) පශ්චාත් උපාධි ඩිප්ලෝමා - ලකුණු 4 | 10 | |

| | | |
|---|---|---|
| (ඇ) උපාධි/පශ්චාත් උපාධි සහතිකය - ලකුණු 2<br><br>**(2) ඵලදායි සන්නිවේදනය/එකඟතාවන්ට පත්වීම /නායකත්වය/රාජ්‍ය ප්‍රතිපත්ති/e – රාජ්‍ය විසඳුම්/ආර්ථික විද්‍යාව සම්බන්ධ පුහුණුව ***<br>(අ) මාස 03 හෝ ඊට වැඩි පාඨමාලා - ලකුණු 1<br>(ආ) දින 10 හෝ ඊට වැඩි පාඨමාලා - ලකුණු 0.5<br>(ඇ) දින 03 හෝ ඊට වැඩි පාඨමාලා - ලකුණු 0.2<br><br>**(3) ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණතාව ***<br>(අ)පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ රජයේ පුහුණු ආයතනයකින් ලබාගත් ඉංග්‍රීසි ඩිප්ලෝමා සහතිකය/IELTS Academic overall score 6.5 හෝ ඊට වැඩි,TOEFL-IBT 79 හෝ ඊට වැඩි,TOEFL-CBT 213 හෝ ඊට වැඩි,හෝ TOEFL-PBT හෝ ඊට වැඩි - ලකුණු 02<br>(ආ)පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ රජයේ පුහුණු ආයතනයකින් ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා ලබා ගත් සහතිකය - ලකුණු 01<br>*උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලැබේ. | | |
| **විශේෂ හැකියාවන්**<br>ඉහත 2.2 ජේදයේ නිශ්චය කර දක්වා ඇති පරිදි අයදුම්කරු අභිපේරණයට ලක් වන අයුරින් අදාළ කාර්යයන් කාර්යක්ෂමව ඉටු කළ යුතුය.<br>1. කණ්ඩායම් හැඟීම පෙරදැරිව ක්‍රියා කිරීම ( ලකුණු 03)<br>2. සේවයට ලැදි බව ( ලකුණු 03)<br>3. කාර්යක්ෂමතාව ( ලකුණු 04) | 10 | සම්මුඛ පරීක්ෂණය |
| **චර්යාත්මක නිපුණතාව**<br>ඉහත 2.3 ජේදයේ නිශ්චය කර දක්වා ඇති පරිදි ක්‍රියාවන් හා ක්‍රියාකාරකම් කාර්යක්ෂමව ඉටු කිරීම අවශ්‍ය වේ.<br>1. නායකත්වය ( ලකුණු 03)<br>2. තීරණ ගැනීමේ හැකියාව (ලකුණු 03)<br>3. ස්වයං සංවර්ධනය හා වෙනත් සේවාලාභී සංවර්ධනය (ලකුණු 04) | 10 | |

සටහන 1 - ඉහත සඳහන් ලකුණු ලබා දීමේ ක්‍රමවේදයේ පිළිගත් විශ්ව විද්‍යාලය යන්නෙන් අදහස් කෙරෙන්නේ ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාල වේ.

සටහන 2 - ඉහත සඳහන් ලකුණු දීමේ ක්‍රමවේදයේ දැක්වෙන සියලුම පශ්චාත් උපාධි සුදුසුකම් ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් ඒවා විය යුතුය. තවද උපාධි පිරිනමන වෙනත් ආයතන වලින් ලබා ගත් එබඳු සුදුසුකම් ද විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන තිබිය යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි ,

ලේකම්
කෘෂිකර්ම අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග
බත්තරමුල්ල

දිනය: 2023.04.19